# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1705/2 - 2011 මැයි 09 වැනි සඳුදා - 2011.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

සංශෝධන අංක 03

2005 පෙබරවාරි මස 25 වැනි දින අංක 1381/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ :

14.3.4 උප වගන්තියට අවසන පහත සඳහන් නව උප වගන්තීන් ඇතුළත් කරනු ලැබේ :

(අ) 2004.12.24 දිනට ප්‍රථම මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බැඳුනු සහ 2012.07.01 දිනට ප්‍රථම විශ්‍රාම යාමට නියමිත අයවලුන් සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) සෙසු අය 2012.07.01 දිනට ප්‍රථම මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

(ඇ) 2012.06.30 දින දක්වා සියලුම මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ට දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමකින් තොරව ස්වකීය වැටුප් වර්ධක උපයා ගැනීමට සහ නියමිත උසස්වීම් ලබාගැනීමට හිමිකම් ලබාදිය යුතුය.

ඊ.එම්.එන්.එම්. ඒකනායක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2011 මැයි මස 03 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
තැ.පෙ. 114, කටුගස්තොට පාර,
මහනුවර.

05-536

1A - PG 001239 —380 (2011/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.